**20 පාඩම 111 කොටස**

**7 ශ්‍රේණිය – සිංහල**

**සකස් කඩ නොකී කට**

**එම්.ඩී.ආර්.මුණසිංහ**

**විරාම ලකුණු නිවැරදි ව හඳුනාගෙන  භාවිතා කරමු.**

කෙටි ඉර **( - )**      ඇල ඉර  **( / )**     දෙතිත **( : )**

**කෙටි ඉර**

- පද හෝ අදහස් එකට සම්බන්ධ කර දැක්වීමේ දී භාවිතා කරයි.

උදා:- දිව්‍ය - මනුෂ්‍ය වශයෙන් වෙන් වේ.

- කාල පරිච්ඡේද දැක්වීමේ දී

උදා:- බු. ව. 2500 – 2600 දක්වා

- යම් පේළියක වචනයක සම්පූර්ණ අකුරු ප්‍රමාණය ලිවීමට ඉඩ මදි වූ විට

උදා:- සංවර්ධ-
-නය

**ඇල ඉර**

- විකල්ප අවස්ථා දැක්වීම

උදා:- ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට ආරාධනා කර සිටිමු.

**දෙතිත**

- සංවාදයක් ලියා දැක්වීමේ දී

උදා:-

කුමරා : අප මේ පැමිණි වන පෙදෙස මුව දඩයමට ඉතා යෙහෙකි ය සොඳුරිය.
කුමරිය: ගමන් විඩාව මිස, ආහාර රුචියක් නොමැත්තේ ය හිමියනි.

- ගණිත ප්‍රකාශනවල අනුපාත දැක්වීම / පැය 24 ඔරලෝසුවේ වෙලාව දැක්වීම

උදා:- 25 සංඛ්‍යාව 2 : 3 අනුපාතයට බෙදන්න.
රැස්වීම පැය 8:30 පැවැත් වේ.

**අභ්‍යාස**

- මෙම ප්‍රශ්න අභ්‍යාස පොතේ පිටපත් කරගෙන පිළිතුරු සපයන්න.

1. ආගමික  සංස්කෘතික තොරතුරු සොයා බලයි.
2. සෙල්මුවා  ගලින් කරන ලද
3. උත්සවය පෙ ව 9 00  12 00 දක්වා පැවැත්වේ.
4. බැංකුව පැය 8 00 ට විවෘත කෙරේ.
5. පියා තම දරුවන් තිදෙනා අතර 3 4 5 අනුපාතයට දේපළ බෙදුවේ ය.
6. මෙම විරාම ලක්‍ෂණ යෙදුණු අවස්ථා 10 දහයක් (20 පාඩම හැර) සොයා ලියන්න.